NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

09 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 10 ඒකකය

### ඉටු කරමු යුතුකම්.

- **සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සමාජයේ ඔවුනොවුන් අතර ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,

(1). අග්ගඤ්ඤ සූත්‍රයයි  (3). අනන්තලක්ඛණ සූත්‍රයයි
(2). දම්සක් පැවතුම් සූත්‍රයයි  (4). සිඟාලෝවාද සූත්‍රයයි

02. සදිසා නමස්කාරයේදී නැගෙනහිර දිසාවෙන් දක්වූයේ,

(1). ගුරුවරුන්ය  (2). දෙමාපියන්ය  (3). පැවිදි උතුමෝය  (4). හිතමිතුරෝය

03. නිෂ්පාදන හා සේවා සැපයීමට වඩාත් ම උපකාරී වන්නේ පහත කවර සමාජ කණ්ඩායමද?

(1). සේව්‍ය, සේවක  (2). ගුරු, ශිෂ්‍ය  (3). මව්පිය, දූදරු  (4). ගිහි, පැවිදි

04. සිඟාලෝවාද සූත්‍රයේදී දක්වන යුතුකම් හා වගකීම් ගණන කොපමණද?

(1). හැට එකකි  (2). හැටකි  (3). තිස් හයකි  (4). හැත්තෑ දෙකකි

05. පැවිදි උතුමන්ගෙන් ගිහි පින්වතුන් විසයෙහි ඉටු විය යුතු යුතුකම් ගණන කොපමණද?

(1). පහකි  (2). හයකි  (3). දහයකි  (4). එකොළහකි

06. සිව්වනක් පිරිසට අයත් නොවන්නේ,

(1). භික්ෂු  (2). උපාසක  (3). පරිබ්‍රාජක  (4). භික්ෂුණී

07. ගුරුවරුන් සදිසාවේදී හඳුන්වා ඇත්තේ කුමන දිසාවටද?

(1). පෙර දිසාවටය  (2). අපර දිසාවටය  (3). උතුරු දිසාවටය  (4). දකුණු දිසාවටය

08. හිත මිතුරන් සදිසාවේදී හඳුන්වා ඇත්තේ කුමන දිසාවෙන්ද?

(1). බටහිර දිසාව  (2). නැගෙනහිර දිසාව  (3). උතුරු දිසාව  (4). යට දිසාව

09. අඹු දරුවන් සදිසාවේදී හඳුන්වා ඇත්තේ කුමන දිසාවෙන්ද?

(1). උඩ දිසාවෙන්  (2). යට දිසාවෙන්  (3). බටහිර දිසාවෙන්  (4). දකුණු දිසාවෙන්

10. දාසකම්කරුවෝ සදිසාවේදී හඳුන්වා ඇත්තේ කුමන දිසාවෙන්ද?

(1). යට දිසාවෙන්  (3). නැගෙනහිර දිසාවෙන්
(2). උඩ දිසාවෙන්  (4). බටහිර දිසාවෙන්

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!


agaram.lk

Agaram.l - Keep your dreams alive!

Agaram.l - Keep your dreams alive!

## II කොටස

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. (1). ගිහි පින්වතාගේ ''ගිහි විනය'' ලෙස හඳුන්වන්නේ කුමක්ද?

    (2). සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කවුරුන් උදෙසාද?

    (3). සිගාලෝවාද සූත්‍රයේ නිදාන කථාව ලියන්න.

02. (1). සදිසා නමස්කාරය යනු කුමක්ද?

    (2). සදිසාවන් හා එයට අදාළ සමාජ කණ්ඩායම් පිළිවෙලින් නම් කරන්න.

    (3). යුතුකම් ඉටුකිරීමෙන් සැලසෙන යහපත පැහැදිලි කරන්න.

03. (1). සදිසාවේදී පැවිදි උතුමෝ ඉහළ දිසාවෙන් තැබීමට හේතුව කුමක්ද?

    (2). පැවිදි උතුමන්ගෙන් ගිහි පින්වතාට ඉටු විය යුතු යුතුකම් නම් කරන්න.

    (3). ගිහි පින්වතා විසින් පැවිදි උතුමන්හට ඉටුවිය යුතු යුතුකම් නම් කරන්න.

04. (1). සේව්‍යයා විසින් සේවකයාට ඉටුකළයුතු යුතුකම් නම් කරන්න.

    (2). සේවකයා විසින් සේව්‍යයාට ඉටුවිය යුතු යුතුකම් නම් කරන්න.

    (3). සේව්‍ය සේවක යුතුකම් ඉටුකිරීමෙන් උද්සෝෂණ, අරගල, ගැටුම් නැතිවී ගොස් සමාජ යහපත, අභිවෘද්ධිය සිදුවන අයුරු පැහැදිලි කරන්න.

05. (1). සිව්පසය නම් කරන්න.

    (2). සිව්වනක් පිරිස නම් කරන්න.

    (3). භික්ෂූන් වහන්සේගෙන් සමාජයට ඉටුවන යහපත පැහැදිලි කරන්න.